ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය

සංචාරක හා ආගන්තුක සත්කාර ව්‍යාපාර ක්ෂේත්‍රය සඳහා මානව සම්පත් සංවර්ධනය උදෙසා අධ්‍යාපන සහ පුහුණුව ලබා දෙන රටේ ප්‍රමුඛතම රාජ්‍ය ආයතනයයි..

හෝටල් සහ ආහාර පාන, මෙහෙයුම් පිළිබඳ උසස් ඩිප්ලෝමාවට මඟපාදන සහතික පත්‍ර පාඨමාලාව

ඇතුළත් වීම සඳහා සැපිරිය යුතු සුදුසුකම්

- වයස අවුරුදු 17 හෝ ඊට වැඩි.
- අ.පො.ස. සාමාන්‍ය පෙළ දෙවරකට නොවැඩි වාර ගණනකදී, විෂයයන් 06ක් (ගණිතය සහ ඉංග්‍රීසි භාෂාව ද ඇතුළත්ව) සමත් විය යුතු අතර, අවම සම්මාන සාමාර්ථයන් තුනක් සහිත විය යුතුය.

හෝ

- SLITHM හි ශිල්පීය පාඨමාලාව සමඟ අදාළ ක්ෂේත්‍රයේ වසරක පුහුණුව

හෝ

- අදාළ ක්ෂේත්‍රයේ වසර දෙකක පුහුණුවක් සහිත දැනටමත් හෝටල් කර්මාන්තයේ රැකියාවක නියුතු වීම.

පාඨමාලා කාලසීමාව: මාස 05 (පූර්ණකාලීන).

මාසික පාඨමාලා ගාස්තුව:

- වෘත්තීය සුපවේදය : රු. 10,000.00
- ආපනශාලා හා අවන්හල් සේවා : රු. 7,000.00
- හෝටල් පිළිගැනීමේ සේවා : රු. 5,000.00
- හෝටල් ගෘහ පාලනය : රු. 5,000.00

- ඉහත සෑම පාඨමාලාවක් සඳහාම ලියාපදිංචි ගාස්තුව රු. 1,000.00 ක් හා විභාග ගාස්තුව රු. 1,000.00 ක් වේ.

පාඨමාලාව පැවැත්වෙන ස්ථානය:
මඩකලපුව සහ යාපනය හැර අනෙකුත් සියලුම පාසල්.

- **අයදුම් කළ හැකි අවසන් දිනය 2026-නොවැම්බර්-25**

SLITHM කොළඹ නො 78 ගාලු පාර, කොළඹ 03	011 220 8312
මහනුවර මහවැලි උයන, කුණ්ඩසාලේ, මහනුවර	081 223 0900
කොග්ගල ආයෝජන ප්‍රවර්ධන කලාපය කොග්ගල, හබරාදුව	091 228 3072/73
අනුරාධපුර ශ්‍රී මහා බෝධි මාවත, අනුරාධපුර	025 223 6667 / 025 222 3315
බණ්ඩාරවෙල ජාතික නිවාඩු නිකේතනය, ගොල්ෆ් ලින්ක් පාර, බණ්ඩාරවෙල	057 223 2499
රත්නපුර කොළඹ පාර, නවනගරය, රත්නපුර	045 222 6464
කුරුණෑගල මහුරුඔය වත්ත, බෝයගනේ, කුරුණෑගල	037 222 3959
SLITHM මඩකලපුව නො 07 සාන්ත සෙබස්තියන් පාර අරසාදි , මඩකලපුව	065 2050306/ 072 6223629
SLITHM යාපනය ප්‍රධාන පාර, චුන්ඩිකුළි, යාපනය	077 5956119

සහතික පත්‍ර පාඨමාලාව - පේස්ට්‍රි හා බේකරි

ඇතුළත් වීම සඳහා සැපිරිය යුතු සුදුසුකම්:

- වයස අවුරුදු 17 හෝ ඊට වැඩි.
- අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී, විෂයයන් 06ක් (ගණිතය සහ ඉංග්‍රීසි භාෂාව ද ඇතුළත්ව) සමත් වී තිබිය යුතු අතර, අවම සම්මාන සාමාර්ථයන් තුනක් සහිත විය යුතුය.

පාඨමාලා කාලසීමාව: මාස 05 (පූර්ණකාලීන)

මාසික පාඨමාලා ගාස්තුව: රු. 20,000.00.

- ලියාපදිංචි ගාස්තුව රු. 1,000.00 ක් හා විභාග ගාස්තුව රු. 1,000.00 ක් වේ.

- **පාඨමාලාව පැවැත්වෙන ස්ථානය**: කොළඹ.

- **අයදුම් කළ හැකි අවසන් දිනය 2026 -නොවැම්බර්-25**

ආගන්තුක සත්කාරක කළමනාකරන පිළිබඳ ජාතික සුදුසුකම (හෝටල් සහ ආහාර පාන, මෙහෙයුම් පිළිබඳ උසස් ඩිප්ලෝමාව) අන්තර් මාධ්‍ය පාඨමාලාව

ඇතුළත් වීම සඳහා සැපිරිය යුතු සුදුසුකම්:

- SLITHM හි සහතික පත්‍ර මට්ටමේ පාඨමාලා සමඟ අදාළ ක්ෂේත්‍රයේ පුහුණුව.

හෝ

- අ.පො.සා සාමාන්‍ය පෙළ විභාගය වාර දෙකකට නොවැඩි ගණනකදී ගණිතය හා ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් 06ක් සමත් වී අවම සම්මාන සාමාර්ථ 03ක් ලබා තිබිය යුතු අතර, අදාළ ක්ෂේත්‍රයේ කළමනාකරණ හෝ අධීක්ෂණ මට්ටමින් වසර 05කට වැඩි සේවා පළපුරුද්දක් සහිතව දැනටද එම ක්ෂේත්‍රයේ සේවයේ නියුතු අයෙකු විය යුතුය.

හෝ

- UGC (විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව) විසින් අනුමත කරන ලද ආගන්තුක සත්කාර කළමනාකරණය (Hospitality) පිළිබඳ විශේෂ උපාධියක් හිමි අයදුම්කරුවන්ට අයදුම් කළ හැකිය. ඒ සඳහා ඔවුන් අදාළ විශේෂිකරණ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක් (01) සේවා පළපුරුද්දක් තිබිය යුතුය.

පාඨමාලා කාලසීමාව: මාස 06 (පූර්ණකාලීන).

මාසික පාඨමාලා ගාස්තුව:

- වෘත්තීය සුපවේදය : රු. 15,000.00
- ආහාර සහ පාන මෙහෙයුම් : රු. 12,000.00
- හෝටල් පිළිගැනීමේ සේවා : රු. 7,500.00
- හෝටල් ගෘහ පාලනය : රු. 7,500.00

- ඉහත සෑම පාඨමාලාවක් සඳහාම ලියාපදිංචි ගාස්තුව රු. 1,000.00 ක් හා විභාග ගාස්තුව රු. 1,000.00 ක් වේ.

- **පාඨමාලාව පැවැත්වෙන ස්ථානය**: කොළඹ පාසල

- **අයදුම් කළ හැකි අවසන් දිනය 2027-ජනවාරි-15**

අයදුම් කළ යුතු ආකාරය

- **www.slithm.edu.lk වෙබ් අඩවිය මගින් මාර්ගගත ක්‍රමයට අයදුම්පතක් යොමු කිරීමෙන්.**
- **සෑම පාඨමාලාවක් සඳහාම අයදුම්පත් ගාස්තුව ලෙස රු. 500.00 ක මුදලක් අය කෙරේ.**
- **අයදුම්පත් ගාස්තුව පහත ගිණුම් අංකයට බැර කර ලදුපතෙහි පිටපතක් අයදුම් කිරීමේ ක්‍රියාවලියේදී උඩුගත කරන්න.**
- **බැංකුව: BOC (ලංකා බැංකුව) | ශාඛාව: ආයතනික ශාඛාව | ගිණුම් අංකය: 0007120156.**
- **වැඩිදුර විස්තර සඳහා කරුණාකර www.slithm.edu.lk වෙබ් අඩවියට පිවිසෙන්න.**

තෝරා ගැනීමේ ක්‍රියාවලිය:

- **අයදුම්කරුවන් ආයතනය මගින් පවත්වන ලිඛිත පරීක්ෂණය සහ සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගී විය යුතුය.**

වෙනත් තොරතුරු:

- **ඔබගේ අයදුම්පත සාර්ථකව යොමු කළ විට ඒ බව විද්‍යුත් තැපැල් පණිවිඩයක් මගින් දැනුවත් කරන අතර, ඉදිරි පියවර පිළිබඳ විස්තර විද්‍යුත් තැපෑල මගින් පමණක් ඔබට දැනුම් දෙනු ඇත.**
- **යම් අයදුම්කරුවෙකු වෙනුවෙන් ආයතනය වෙත කෙරෙන සියලු ආකාරයේ බලපෑම් පාඨමාලාව හැදෑරීම සඳහා නුසුදුසුකමක් ලෙස සලකනු ලැබේ.**



ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය,
අංක 78, ගාලු පාර, කොළඹ 03.
වෙබ් අඩවිය : www.slithm.edu.lk
දුරකථන: 011 2208312